# නර්තනය - 6 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

## හිරුට කළගුණ දක්වන තෛපොංගල් උත්සවය

හින්දු බැතිමතුන් ඉතා භක්තියෙන් සමරන උත්සවයක් ලෙස මෙය හැඳින්විය හැක. අවුරුද්දේ පළමු මාසය වන 'තෛ' මාසය නමින් හඳුන්වන ජනවාරි මාසයේ 15 වන දින මෙම උත්සවය සමරනු ලබයි. කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන් අළුත් අවුරුද්දේ වැඩ ආරම්භ කරන දිනය ලෙස මෙම දිනය සමරනු ලබයි. තම අස්වැන්න සරුසාර කිරීමට උපකාරී වූ හිරු දෙවියන්ට පළමුවත් ගොවිතැනට උපකාර වන ගවයන්ට හා එළුවන්ට දෙවනුවත් කළගුණ දැක්වීම මෙම උත්සවයේදී සිදු කරයි.

## තෛපොංගල් උත්සවයේ සැරසිලි

තම නිවෙස් පිරිසිදු කර හිරු දෙවියන්ට තම නිවසට පැමිණෙන ලෙස කරන ඇරයුමක් ලෙස නිවෙස් සැරසීම.
වර්ණ ගැන්වූ හාල් පිටි හා කහ කුඩු යොදා ගනිමින් අලංකාර කෝලම් රටා නිර්මාණය කිරීම.
එම රටා මැද පොල්තෙල් පහන් හා පුන්කලස් තැබීම.
අඹ කොළ කොහොඹ කොළ ගොක් කොළ ආදියෙන්
සැරසීම. උක් ගස් සිටුවීම.

## තෛපොංගල් උත්සවයේ චාරිත්‍ර

හිරු උදාවන මොහොතේ නිවෙස් දොරටුව අසල නැගෙනහිර දෙසට මුහුණලා තැනූ ලිපක් මත කිරි ඉතිරවීම. අළුත් හාල් මුට්ටියට දමන අතර නිවසේ සියලු දෙනා පොංගල් පෙංගලේ කියමින් සූර්ය වන්දනාවේ යෙදීම. මුං තල හකුරු සූකිරි එළකිරි මිශ්‍ර පොංගල් බත සකස් කිරීම.

විශේෂ අවස්ථා

1. මාට්ටු පොංගල්

සූර්ය වන්දනාව නිමකර පසු දින තම ගොවිතැනට උපකාර කළ ගවයින්ට හා එළුවන්ට කළගුණ දැක්වීම මෙම උත්සවයේ සිදුකරයි. ගවහල් හා එළුගාල් පිරිසිදුකර ගොම පිරියම් කර සුදුහුනු වලින් රටා ඇඳ කිරි උතුරවා කිරිබත් පිස කෙසෙල් ගෙඩි හා කිරිබත් එම සතුන්ට කවා කළගුණ දැක්වීම මේ නමින් හඳුන්වයි.

2. පට්ට පොංගල්

ඇතැම් ගම්වල ගවයින් කරත්ත වල බැද 'පෙංගල්' 'පෙංගල්' කියමින් ගමේ සංචාරය කිරීම මේ නමින් හඳුන්වයි.

3. තන්නි පොංගල්

මෙය ඉන්දියාවේ දක්නට ලැබෙන උත්සවයකි. උස් පහත් භේදයකින් තොරව සැවොම එකතුවී එකිනෙකාට ආශිර්වාද කර ගැනීමත් කෑම බීම බෙදා හදාගෙන සතුටු වීමත් මෙදින සිදු කරයි.

**තෛපොංගල් උත්සවයේ චාරිත්‍ර විධි**



**කාර්ය පත්‍රකාව**

1. තෛපොංගල් උත්සවය ................. දෙවියන්ට පූජෝපහාර කිරීමට පවත්වයි.
2. ................. රටා නිර්මාණය තෛපොංගල් උත්සවයේ දක්නට ලැබේ.
3. තෛපොංගල් දිනයේ සැරසිලි සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය 3 ක් ලියන්න.
4. තෛපොංගල් උත්සවයේ අවස්ථා 02 සදහන් කරන්න


- උපදේශකත්වය – එස්. එම්. ඩී. ජී .සේනානායක (ස. අ .අ. නර්තන ක. අ. කා. හෝමාගම)
- ටී. එච්. ප්‍රියන්තා දමයන්ති මිය (බප/ හෝ/ බෝපේ රාජසිංහ මහා විද්‍යාලය)
- එම්. අයෝමා විමලවීර මිය (බප/ හෝ/ පාදුක්ක සිරි පියරතන ම.ම.වි.)
- ඩී.එස්. තරංගා දැරණියගල මිය (බප/ හෝ/ සුභාරතී මහාමාත්‍ය මහා විද්‍යාලය